Good Food, Good Life

Nestlé Lanka PLC News Release

Colombo: 27 April 2016

# නෙස්ලේ ලංකා සමාගම අවුරුදු සමරයි

නෙස්ලේ ලංකා සමාගම සිය ප්‍රධාන කාර්යාලයේදී එම සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂිකා ශිවානි හෙග්ඩේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් සහ තම කාර්යමණ්ඩලයේ සහභාගීත්වයෙන් අලුත් අවුරුද්ද උත්කර්ෂවත් ලෙස සමරණ ලදි. 'කිරි ඉතිරීම' සහ 'පොල් තෙල් පහන දැල්වීම' සමග අවුරුදු උත්සවයේ ක්‍රීඩා ඉසව් ආරම්භ කළ අතර සම්ප්‍රදායික අවුරුදු උදෑසන කෑම වේලක්ද ලබා දෙන ලදි.

ඉන් පසුව සම්ප්‍රදායිකව 'ගනු දෙනු' චාරිත්‍රය 'ගැමි ගෙදර' මණ්ඩපයේදී සිදුකරන ලදි. අවුරුදු ක්‍රීඩා සඳහා කාර්යමණ්ඩලය මහත් උද්යෝගයෙන් සහභාගිවූ අතර 'කණා මුට්ටි', 'කොට්ට පොර', පොල් ගෑමේ තරඟය, නෙස්ටමෝල්ට් පානය කිරීමේ තරඟය සහ 'ඔන්චිලි පැදීම' වැනි තරඟ ඉසව් එහිදී පවත්වන ලදි.